## ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාව දීම, ඉවසීම හා විශ්වාසය යන යනාදී මානුශීය ගුණාංග

ෆාතිමා

නුහුරුයි නුපුරුදුයි නුඹ

හමුවුණු මුල්ම දිනයෙම

සරසවියෙ තනි නොතනියට

නුඹයි මව උනේ මට පසුව

ගිනි ඇවිලුණු පාස්කුවට

නොමිනිසුන්ගේ වරදකට

වපර ඇසින් බැලුවාලු මිනිසුන්

නුඹ නොකල වරදකට

මා බදාගෙන වරුවක්

නුඹ හැඩුවා ෆාතිමා නුඹ වැරදි වෙනවද කෝම?

රාමලාන් සඳ බලන්න

නුඹත් මාත් ගියේ එකට

නුඹ ඇන්ද මරතොණ්ඩි රටාවල් සේරම

හැඩ කළා මගෙ අත්ලත් නුඹේ තරමටම

හැමදාම හවසට බුදු පහන තියන්නට මට

මල් ගෙනාවෙ නුඹ ඒ දවස්වල

පාන්දර දෙක තුනේ කණිසමට

නුඹ අල්කුරාණය කියා දුන්නා මට දවසක

බුදුරදුන්ද අල්ලාහ් දෙවියන්ද

ධම්මපදයද අල්කුරානයද

එකට වැඩ හිදපු කුටියක

අපි සතුටින් හිටියා නේද ඉතිමා

කැවුම් කිරිබත් වටලප්පන්

මේ ඔක්කොම බෙදාගෙන

සම්පූර්ණ නම- එච්.එම්.යාෂිනි තරංගා චන්ද්‍රසිරි

වයස කාණ්ඩය -16-29 (වයස 25)

විද්‍යුත් ලිපිනය- yashinitharanga@gmail.com

හැඳුනුම්පත් අංකය -965992561v

2021.09.10 දිනට වයස-අවුරුදු 25 මාස 5 දින 02